පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2017

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................
..........................................................................................................

කාලය : පැය 02 යි.

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය I

**සැලකිය යුතුයි :**

❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ වඩාත් නිවැරදි වරණය තෝරන්න.

01. පහත ඒවායින් විස්තරාත්මක වාක්‍යයක් වන්නේ,
    (1) පුත, ඉදිරියට යනු (2) දේව ආශිර්වාද ලැබේවා !
    (3) බුද්ධික කටකාර නැත. (4) ජනතාව වෙතට පැමිණෙන්න.
    (5) ගැත්තාට කමා කළ මැනව.

02. "කිසිදෙයක් එය වීමටත්, නොවීමටත් පුළුවන් කමක් නැත." යන ප්‍රකාශයෙන් පැහැදිලි වන චින්තන නියමය,
    (1) අනන්‍යතා නියමය. (2) විසංවාදී නියමය. (3) මධ්‍ය බහිස්කෘත නියමය.
    (4) පර්යාප්ත හේතු නියමය. (5) ද්විත්ව නිශේධන නියමය.

03. පර්යාප්ත හේතු නියමය ඉදිරිපත් කරනු ලැබුවේ,
    (1) ජේවන්ස් (2) ඇරිස්ටෝටල් (3) ඇරිස්ටාකස්
    (4) ලයිබ්නිට්ස් (5) ජෝර්ජ් බූල්

04. ප්‍රස්තුතයක වාච්‍යය හෝ වාචකය ලෙස යෙදෙන වචනයක් හෝ වචන සමූහයක් තර්ක ශාස්ත්‍රයේ හැඳින්වෙන්නේ,
    (1) ප්‍රස්තුත ලෙස ය. (2) සංවාක්‍ය ලෙස ය. (3) සංක්ෂේපමාලා ලෙස ය.
    (4) ලුප්ත සංවාක්‍ය ලෙස ය. (5) පද ලෙස ය.

05. "බාල - මහලු" යන්න අයත් වන්නේ කුමන පද වර්ගයට ද?
    (1) විසංවාදී පදයකි. (2) ප්‍රතිජානන පද (3) ප්‍රත්‍යනීක ලද
    (4) වෛකල්‍යවාචී පද (5) වියුක්ත පද

Education NCP - www.edncp.lk

06. " A ", " B " ගේ පියා ය.

(1) සමමිතික (2) අසමමිතික (3) සංක්‍රාන්තික

(4) සමමිතික සංක්‍රාන්තික (5) සමමිතික අසංක්‍රාන්තික

07. "මිනිසා - මැරෙන සුලු මිනිසා" යන්නෙහි,

(1) වස්තු අර්ථය වැඩි වී ඇත.

(2) වස්තු අර්ථය වැඩිවන විට ගුණාර්ථය අඩු වී ඇත.

(3) ගුණාර්ථය වැඩි වී ඇත.

(4) ගුණාර්ථය වෙනස්වන විට වස්තු අර්ථයේ වෙනසක් නැත.

(5) ගුණාර්ථය වැඩි වී වස්තු අර්ථය අඩු වී ඇත.

08. කරුණු දෙකකින් එකක් පමණක් කියැවෙන ප්‍රස්තුත,

(1) නිරුපාධික ප්‍රස්තුතයි. (2) සෝපාධික ප්‍රස්තුතයි.

(3) උභතෝකෝටික ප්‍රස්තුතයි. (4) වියෝජක ප්‍රස්තුතයි.

(5) මිශ්‍ර සෝපාධික ප්‍රස්තුතයි.

09. I ප්‍රස්තුතයක පද ව්‍යාප්තිය වනුයේ,

(1) ප්‍රතිජානන / ප්‍රතිෂේධනය (2) ව්‍යාප්ත / ව්‍යාප්ත (3) අව්‍යාප්තයි / ව්‍යාප්තයි

(4) ව්‍යාප්තයි / අව්‍යාප්තයි (5) අව්‍යාප්තයි / අව්‍යාප්තයි

10. ප්‍රමාණයෙන් හා ගුණයෙන් එකිනෙකට වෙනස් ප්‍රස්තුත අතර දැකිය හැකි ප්‍රතියෝගය වන්නේ,

(1) විසංවාදී (2) ප්‍රත්‍යනික (3) උප ප්‍රත්‍යනික

(4) උපාශ්‍රයන (5) ද්විත්ව නිෂේධන

11. A ප්‍රස්තුතයක පරස්ථාපිතය වන්නේ,

(1) A ප්‍රස්තුතයකි. (2) E ප්‍රස්තුතයකි. (3) I ප්‍රස්තුතයකි.

(4) O ප්‍රස්තුතයකි. (5) පරස්ථාපනය කළ නොහැක.

12. එක් එක් පූර්ව සංවාක්‍යයේ නිගමනය ලොප් කොට සරල කොට පැවසෙන ප්‍රගාමී තර්කනාවලියක් හැඳින්වෙන්නේ,

(1) සංවාක්‍යයක් ලෙසය. (2) ලුප්ත සංවාක්‍ය ලෙසය.

(3) සංක්ෂේප මාලාවක් ලෙසය. (4) සංවාක්‍ය ප්‍රකාරයක්

(5) සංවාක්‍ය උප ප්‍රකාරයක් ලෙසය.

Education NCP - www.edncp.lk

13. මින් සංවාක්‍ය සිව්වන ප්‍රකාරයට අයත් නොවන උප ප්‍රකාරය වන්නේ,

(1) BRAMANTIP (2) DIMARIS (3) FESAPO
(4) DATISI (5) FREESISON

14. "පළතුරු මිල අධිකය, එළවළු මිල අධිකය. එහෙයින් එළවළු පළතුරුය" මෙහි දක්නට ඇති ආභාසය නම්,

(1) අයථා සාධ්‍ය ලද (2) අයථා පක්ෂ පද (3) ද්විත්ව නිශේධන
(4) චතුස් පද (5) අව්‍යාප්ත මධ්‍ය පද ආභාසය වේ.

15. "විද්‍යාවක් අනෙකුත් ශාස්ත්‍රයන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා වූ අසත්‍යකරණ රීතින් ඉදිරිපත් කළේ,

(1) කාර්ල් පොපර් (2) කාර්ල් හෙම්පල් (3) ජේ. එස්. මිල්
(4) තෝමස් කුන් (5) රදර්ෆඩ්

16. පහත ඒවායින් ව්‍යවහාරික විද්‍යාවක් නොවන්නේ,

(1) මනෝ චිකිත්සාව (2) රසායන විද්‍යාව (3) දන්ත චිකිත්සාව
(4) ඉංජිනේරු විද්‍යාව (5) වෛද්‍ය විද්‍යාව

17. පහත තාර්කික ව්‍යුහයෙන් විස්තර කෙරෙන විධික්‍රමය වන්නේ,

උ → අ
අ
―――――
∴ උ

(1) උද්ගමන වාදය (2) නිගාමී අසත්‍යකරණ වාදය
(3) නිගාමී සත්‍යෙක්ෂණ වාදය (4) සාපේක්ෂතා වාදය
(5) එකක්වත් නොවේ.

18. යමෙක් ලණු කැබැල්ලක් සර්පයෙකු හැටියට නිරීක්ෂණය කිරීම විද්‍යාත්මක ක්‍රමයේ දී හඳුන්වන්නේ,

(1) සම්. පරීක්ෂණය (2) අනිරීක්ෂණය (3) නිරීක්ෂණය
(4) දුර්. නිරීක්ෂණය (5) පරීක්ෂණය

19. කපුටන් කිහිප දෙනෙකු පරීක්ෂා කර බලා සියලු කපුටන් කළු පාටය යන නිගමනයට යාම,

(1) අනාවැකියයි. (2) පූර්ණ උද්ගමනයයි. (3) සාදෘශ්‍ය අනුමානයයි.
(4) ප්‍රාථමික කරුණයි. (5) අපූර්ණ උද්ගමනයයි.

Education NCP - www.edncp.lk

20. පාලිත කණ්ඩායම් ක්‍රමය සඳහා නිදසුනකි.

(1) බොයිල්ගේ නියමය

(2) ජලභීතිකා එන්නත සොයා ගැනීම

(3) ඩාවින්ගේ පරිණාම වාදය

(4) වැද්දන්ගේ චර්යා නිරීක්ෂණය

(5) සියල්ලම

21. "මව යනු මාතාවයි" යන නිදසුන වඩා යෝග්‍ය වන්නේ,

(1) විතත

(2) විස්තරාත්මක

(3) පර්යාය පද මඟින් කෙරෙන

(4) නිර්දිෂ්ට

(5) නාම මාත්‍ර නිර්වචනයටයි.

22. "මේ මව ජීවත් වන්නේ ඇගේ දරුවන් උදෙසාය" යන්න,

(1) කාර්ය බද්ධ (2) හේතුමය (3) සම්භාවිතාමය

(4) සාධ්‍යතාමය (5) ව්‍යවහාර ව්‍යඤ්ජනය වේ.

23. ආවර්තිතා වගුව ඉදිරිපත් කළේ,

(1) ගැලේන් (2) බැබේ (3) ආකිමිඩීස්

(4) රාමනුජන් (4) මෙන්ඩලීෆ්

24. වරකට විචල්‍යයක් පමණක් පාලනය කරමින් කරනු ලබන පරීක්ෂණය,

(1) පරමාදර්ශී සම්. පරීක්ෂණය

(2) නිරීක්ෂණයයි.

(3) සම්. පරීක්ෂණයයි.

(4) පරීක්ෂණයයි.

(5) ප්‍රත්‍යෙක පරීක්ෂණයයි.

25. මිනිසුන් යන වර්ගයේ අනුපූරක වර්ගය,

(1) මිනිසුන් නොවන (2) සතුන් (3) සතුන් නොවන

(4) උභයජීවී (5) දෙවියන්

Education NCP - www.edncp.lk

26. “මිනිසුන් පමණක් මැරෙන සුළුය” යන්නෙහි නිවැරදි වෙන් රූපය,

(1)




(2)




(3)




(4)




(5)




27. ශාස්ත්‍රඥයින්ගේ හා ශිල්පීන්ගේ සම්ප්‍රදාය එකට එක් කළ යුතුය යන අදහස දැරූ විධික්‍රමවාදියා,

(1) ගැලීලියෝ (2) කාර්ල් හෙම්පල් (3) ප්‍රැන්සිස් බේකන්

(4) කාර්ල් පොපර් (5) අර්නස්ට් නේගල්

28. පහත වෘත්තීන් අතරින් මේසන් වැඩ කරන්නා අයත් වන්නේ කුමන ගණයට ද?

(1) ශාස්ත්‍රඥයින් (2) විධික්‍රමවාදීන් (3) විද්‍යාඥයින්

(4) ශිල්පීන් (5) සැලසුම් නිර්මාණකරුවන්

29. ඉතිහාසයේ උපන්‍යාසයක් බහිෂ්කරණය වූ අවස්ථාවකට උදාහරණයකි,

(1) සූර්ය කේන්ද්‍රවාදය (2) ජීව ජන වාදය (3) ගුරුත්වාකර්ෂණ වාදය

(4) ඔක්සිකරණය (5) ෆ්ලොජිස්ටන් වාදය

30. විද්‍යාත්මක උපන්‍යාසයක් සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) ගැටළුවකට සතුටුදායක විසඳුමකි. (2) ආනුභූතික පරීක්ෂණවලට භාජනය කළ හැකි ය.

(3) හැකිතාක් සරල විය යුතුය. (4) ස්වයං විරෝධී නොවිය යුතුය.

(5) අනාවැකි එල කළ හැකි නොවේ.

Education NCP - www.edncp.lk

31. $C_1$ $C_2$ $C_3$ ………… $C_k$

$L_1$ $L_2$ $L_3$ ………… $L_r$

---

$\therefore$ E

මෙහි පළමු පේළියෙන් විස්තර කෙරෙන්නේ,

(1) පොදු නියමයන් (2) විශේෂ කරුණු (3) ප්‍රාථමික කරුණු

(4) සාමාන්‍ය කරුණු (5) අදාළ කරුණු

32. "නිරීක්ෂණය" ඉතා සාර්ථක පරීක්ෂණ ක්‍රමයක් ලෙස යොදාගත් අවස්ථාවක් නම්,

(1) චාල්ස් ඩාවින් පරිණාමවාදය ඉදිරිපත් කිරීම (2) බොයිල්ගේ නියමය ඉදිරිපත් කිරීම

(3) ලුවී පාස්චර් ජලභීතිකා එන්නත නිපදවීම (4) සාපේක්ෂතාවාදය ඉදිරිපත් කිරීම

(5) ඩයිනමෝව නිපදවීම

33. පොපර්ට අනුව රසායන විද්‍යාව, ක්‍ෂුද්‍ර විද්‍යාව, භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව වැනි විෂයන් අයත් වන්නේ,

(1) ශාස්ත්‍ර (2) ව්‍යවහාරික විද්‍යා (3) ආචාර විද්‍යා

(4) ආනුභවික විද්‍යා (5) ආනුභවික නොවන විද්‍යාවයි.

34. යම්කිසි දෙයක පැවැත්ම, හොඳ - නරක, යුතු - අයුතු ලෙස ඇගයුමක් දිය හැකි විද්‍යාවක් වන්නේ,

(1) භූගර්භ විද්‍යා (2) ශුද්ධ විද්‍යා (3) ව්‍යවහාරික විද්‍යා

(4) භෞතීය විද්‍යා (5) ප්‍රාමාණික විද්‍යා

35. පොපර්ට අනුව පහත ඒවායින් විද්‍යාවක් නොවන්නේ,

(1) මාක්ස් වාදය (2) රසායන විද්‍යාව (3) උද්භිද විද්‍යාව

(4) භූගර්භ විද්‍යාව (5) වෛද්‍ය විද්‍යාව

36. "කිසියම් වායුවක උෂ්ණත්වය නියත ව පවතිද්දී එහි පරිමාව හා පීඩනය ප්‍රතිලෝමානුපාතික ව විචලනය වේ." යන්න ඉදිරිපත් කරන්නේ,

(1) කෙප්ලර්ගේ නියම වලිනි. (2) බොයිල්ගේ නියමයෙනි. (3) හුක්ගේ නියමයෙනි.

(4) ගුරුත්වාකර්ෂණ වාදයෙනි. (5) සාපේක්ෂතා වාදයෙනි.

37. කිසියම් ප්‍රපංචයක් පිළිබඳ ව අතීත / වර්තමාන ආදී වශයෙන් තොරතුරු එක්රැස් කර නිගමනවලට එළඹෙන ක්‍රමය,

(1) අන්තරාවලෝකනයයි. (2) ප්‍රශ්නමාලා ක්‍රමයයි. (3) ප්‍රත්‍යක්ෂ පරීක්ෂණයයි.

(4) සම්මුඛ සාකච්ඡාවයි. (5) සමාජ මිතික පරීක්ෂණයයි.

Education NCP - www.edncp.lk

38. විප්ලවයට පෙර විද්‍යාඥයාගේ ලෝකයෙහි සිටින තාරාවුන් විප්ලවයෙන් පසුව හාවුන් වන්නේ යැයි ලීවේ කවුද?

(1) පෝල් පයරාබන්ඩ් (2) රසල් හැන්සන් (3) මයිකල් පොලාන්පි

(4) තෝමස් කුන් (5) ස්ටීවන් ටූල්මින්

39. සාමාජීය විද්‍යාවක් නොවන්නේ,

(1) දේශපාලන විද්‍යාව (2) පුරා විද්‍යාව (3) ඉතිහාසය

(4) ආර්ථික විද්‍යාව (5) ආචාර විද්‍යාව

40. තාක්‍ෂණික ශිල්පයකි,

(1) ඉංජිනේරු විද්‍යාව (2) භූගර්භ විද්‍යාව (3) ඉතිහාසය

(4) පුරා විද්‍යාව (5) තාරකා විද්‍යාව

41. උද්ගමනවාදී විධික්‍රමයෙහි දුර්වලතා පෙන්වූ අයෙකි,

(1) ජේ. එස්. මිල් (2) ඩේවිඩ් හ්‍යුම් (3) කොපර් නිකස්

(4) ප්‍රිස්ට්ලි (5) අයින්ස්ටයින්

42. ප්‍රස්තුත ප්‍රතියෝගයේ දී සත්භාවය (පැවැත්ම පිළිබඳ) ගැටළුව පැන නගින්නේ,

(1) වාච්‍යයේ ප්‍රකාශිත වර්ගය සත්‍ය වූ විටය.

(2) වාච්‍යයෙන් ප්‍රකාශිත වර්ගය අසත්‍ය වූ විටය.

(3) වාච්‍යයෙන් ප්‍රකාශිත වර්ගය සැබවින් ම නොපවතින විටය.

(4) වාච්‍යයෙන් ප්‍රකාශිත වර්ගය සැක සහිත වන විටය.

(5) වාච්‍යය හා වාචකය අසත්‍ය වන විටය.

43. ආකෘති යොදාගන්නා ශිල්පීන් වර්ගයකි,

(1) මනෝ චිකිත්සකයින් (2) ආර්ථික විද්‍යාඥයින් (3) ඉතිහාසඥයින්

(4) ගෘහ නිර්මාණ ශිල්පීන් (5) පුරා විද්‍යාඥයින්

44. "මහා පිපුරුම් වාදය" කුමන විද්‍යා වර්ගීකරණයකට අයත් ද?

(1) ජීව විද්‍යා (2) සමාජ විද්‍යා (3) ප්‍රාමාණික විද්‍යා

(4) චර්යා විද්‍යා (5) භෞතික විද්‍යා

Education NCP - www.edncp.lk

45. "විද්‍යාවේ නිරීක්ෂණය පැවැත්විය නොහැකි හැම විටම සම්. පරීක්ෂණය පැවැත්විය යුතුය." මෙම ප්‍රකාශය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) එකඟ විය නොහැක. (2) එකඟ විය හැක. (3) ප්‍රකාශය නිවැරදි ය.

(4) තරමක් දුරට නිවැරදි ය. (5) සත්‍යයෙන් තොර යැයි කිව නොහැක.

46. අනාවැකිය අසත්‍යතාව මත උපන්‍යාසය අසත්‍ය බව නිගමනය කිරීමට නම් ................... කිසිම එකක් මෙන් ම ................... වලින් කිසිවක් අසත්‍ය නොවන බව දත යුතුය. හිස්තැන් සඳහා සුදුසු පිළිතුර,

(1) අනාවැකි, ප්‍රාථමික කරුණු (2) ප්‍රාථමික කරුණු, සහායක උපන්‍යාස

(3) ප්‍රාථමික කරුණු, ආනුභූතික පරීක්ෂණ (4) ආනුභූතික පරීක්ෂණ, සහායක උපන්‍යාස

(5) අනාවැකි, සහායක උපන්‍යාස

47. ප්‍රස්තුත ප්‍රතියෝගයට අනුව A අසත්‍ය වන විට E, I හා O ප්‍රස්තුතවල සත්‍යතා ඇගයුම් වන්නේ,

(1) සත්‍ය, සත්‍ය, අසත්‍ය (2) සත්‍ය, අසත්‍ය, අසත්‍ය

(3) අවිනිශ්චිත, අවිනිශ්චිත, සත්‍ය (4) අවිනිශ්චිත, අවිනිශ්චිත, අසත්‍ය

(5) අවිනිශ්චිත, සත්‍ය, සත්‍ය

48. වර්ග තර්කයේ දී $\bar{A} \neq \emptyset$ , $\bar{B} = \emptyset$ දී ඇත්නම් පහත දැක්වෙන කුමක් සප්‍රමාණ නිගමනයක් ලෙස ගත හැකි ද?

(1) $AB = \emptyset$ (2) $\bar{A}B = \emptyset$ (3) $A\bar{B} \neq \emptyset$

(4) $B\bar{A} \neq \emptyset$ (5) $AB \neq \emptyset$

49. ඇරිස්ටෝටල්ට අනුව සප්‍රමාණ වුවත්, වෙන් රූප වලට අනුව නිෂ්ප්‍රමාණ වන උප ප්‍රකාරයයි,

(1) පෙරියෝ (2) සෙසරේ (3) ඩිසමිස්

(4) දාරිය (5) ෆෙසපෝ

50. ආචාරධර්ම හා මිනිස් හැදියාව විනාශ වීම, රූපවාහිනී හා පරිගණක වැනි දේවල අසභ්‍ය දර්ශන, මත්ද්‍රව්‍ය උවදුර, ජංගම දුරකථන උවදුර ආදී සියල්ල සිදුවීමට බලපා ඇත්තේ,

(1) නවීන තාක්ෂණික දියුණුව (2) නාගරීකරණය

(3) විද්‍යාව දියුණු වීම (4) මිනිස් ක්‍රියාකාරකම්

(5) සන්නිවේදන දියුණුව

***



Education NCP - www.edncp.lk